ග්‍රීක මූර්ත නිර්මාණ

ඔබට සපයා ඇති කියවීම් පත්‍රිකා හා ඡායා රූප හොඳින් අධ්‍යානය කර පහත දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

කියවීම් පත්‍රිකාව

මූර්ති කලාව ගැන විමසීමේ දී ඉතා වැදගත් රටක් ලෙස ග්‍රීසිය හැඳින් විය හැක. ග්‍රික මූර්ති කලාව යුගයෙන් යුගය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වුවකි. ග්‍රීක කලාවේ වර්ධනයක් දක්නට ලැබෙන්නේ ග්‍රීක සම්බව්‍ය යුගයේ දී ය. මෙම යුගයේ බිහිවූ නිර්මාණ වල මාධ්‍ය වූයේ කිරිගරුඬය. ග්‍රීක සම්බව්‍යය යුගයේ නිර්මාණ අතර ප්‍රංශයේ ලුවර් කෞතුකාගාරයේ ඇති වීනස් ඩී මෙලෝ ප්‍රතිමාව නිර්මාණ ශිල්පී ඇලැක්සැන්ඩ්‍රෝස් විස්න් නිර්මාණය කරන ලද කාන්තා ලාලිත්‍ය මැනවින් ද්වා ඇති විශිෂ්ඨ මූර්තියකි. කවපේත්ත විසිකරන්නා නැමැති මූර්ත්ය මයිරන් නම් ශිල්පියාගේ නිර්මාණයකි . පිරිමියෙකු සතු කායික ජවය ශක්ති ය වගේම චලනය ද ඉතා දක්ෂ ලෙස නිර්මාණය කර ඇත. ප්‍රැක්සි ටෙලස්ගේ නිර්මාණයක් වූ හර්මිස් හා ඩයෝනීසස් මූර්තිය පුරුෂ දේහ ලක්ෂණ මැනවින් පෙන්වන ඔලිම්පියාවේ පුරා විද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කර ඇති විශිෂ්ඨ නිර්මැණයකි. හර්මිස් විසින් කුඩා ඩයනීසස්ව ඉහලට ඔසවා සිටින් අයුරු මෙයින් නිරූපනය වේ. දැවයෙන් නිර්මාණය කර රණින් හා ඇත් දලින් ආවරණය කරන ලද ඇතීනා දෙවගනගේ ප්‍රතිමාව පීඩියස් නම් ශිල්පියාගේ නිර්මාණය කි. ප්‍රතාවත් බව රණසූරත්වය , එඩිතර බව,ඍජුබව යන ලක්ෂණ සහිත්ව කාන්තා සුන්දරත්වය මෙම ප්‍රතිමාවෙන් නිර්මාණය වේ.

කිරි ගරුඬෙන් නිමවූ ලැවකුන් මූර්තිය හෙලනිස්ටික් යුගයේ හමුවූ විශිශිෂ්ඨ නිර්මාණයකි. දැවැන්ත මුහුදු සර්පයෙකු විසින් පිය පුතු තිදෙනා වෙලාගන සිටින අයුතරු හැගුම් දනවන අයුරින් නිර්මාණය කර ඇත. සරපයාගෙන් ගැලවීමට දරණ උත්සාහය වේදනාව හා ත්‍රාසය හොඳින් මතුකර ඇත. මෙය දැනට රෝමයේ වතිකානු කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

වීනස් ඩී මෙලෝ

කවපෙත්ත විසිකරන්නා

ඇතිනා දෙවගන

ලැවකුන්

හර්මිස් සහ ඩයොනීසස්

නිර්මාණයේ නම	නිර්මාණ ශිල්පියා	මාධ්‍ය	යුගය	දක්නට ඇති ස්ථාන	කලා ලක්ෂණ(රූප භාවිතය හා භාව ප්‍රකාශනය)